පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சி திணைக்களம் (மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහ පාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| මගේ අංකය / எனது இலக்கம் / My No. | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date |
|---|---|---|
| LGD/02/21/03/111 | | 2018.05.31 |

පළාත් පාලන සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

ඉංජි. එල්.ආර්.එල්. වික්‍රමරත්න
නාගරික කොමසාරිස් (වැ.බ)

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

ගරු ආණ්ඩුකාරතුමාගේ අංක: GOS/ADM/4/7/339 හා 2018.05.11 දිනැතිව අනුමත කර ඇති බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවන බව කාරුණිකව දන්වමි.

ඩී.එස්.බී.එම්.මෛත්‍රීරත්න,
පරිපාලන නිලධාරි,
පළාත් පාලන කොමසාරිස්(බ.ප) වෙනුවට.

කොළඹ මහ නගර සභාව
04 JUN 2018
OR01 | RD07 | MLPO(DO)
ලේඛන දෙපාර්තමේන්තුව



| ලිපිනය / Address | අංක.02, කේම්බ්‍රිජ් ටෙරසය, කොළඹ 07. / இல.02, கேம்பிறிஜ் டெரஸ், கொழும்பு 07. / No.02, Cambridge Terrace, Colombo 07. | | | | | |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / Head Office | පාලන අංශය හා මානව සම්පත් අංශය Administration / Human Resource | නීති අංශය Legal | සැලසුම් අංශය Planning | ගිණුම් අංශය Accounts | විමර්ශන අංශය Investigation | ඉංජිනේරු අංශය Engineering | ප්‍රජා සංවර්ධන අංශය Community Dvp. |

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප)<br>යොමු අංකය LGD/2/21/3/111 | දිනය 2017.11.07 |
| 1.2 | අමාත්‍යාංශය | පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)<br>යොමු අංකය CM/WP/EIS/3/1-49 | දිනය 2017.11.20 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය DMS/WP/0601-Tem | දිනය 2017.02.22 |
| 1.4 | ප්‍රධාන ලේකම්(බ.ප)ගේ නිර්දේශය | යොමු අංකය CSO/PTR/11/1/21 | දිනය 2018.01.10 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය | දිනය |
| 1.6 | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය | දිනය |
| 1.7 | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | යොමු අංකය | දිනය |

02. පත්කිරීම් බලධරයා - කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්

ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

03. සේවා ගණය පිළිබඳ විස්තර -

| | | | |
|---|---|---|---|
| 3.1 | සේවා ගණය | - | ප්‍රාථමික අර්ධ ශිල්පීය |
| 3.2 | ශ්‍රේණි | - | III/ II / I හා විශේෂ |
| 3.3 | පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය | - | කොළඹ මහා නගර සභාවේ ආරක්ෂක අංශයේ කටයුතු හා කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික ආරක්ෂක පහසුකම් සම්පාදනයට අදාල වන ඒ ඒ අංශවල ප්‍රධානීන් විසින් පවරනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අදාලව පැවරේ. (මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් ආරක්ෂක තනතුරට අදාලව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.) |
| 3.4 | කාර්යයන් පැවරීම | - | ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොවන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යේෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට පත්කිරීම් බලධරයා විසින් පවරනු ලැබිය හැකිය. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : BS/A7/.../7/337
දිනය : 2018/5/11

04 තනතුරෙහි/තනතුරුවල ස්වභාවය - ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත

05 වැටුප්

5.1 වැටුප් කේත අංකය - PL-2 2016 රා.ප.ච. ලේ. 03/2016 අනුව

5.2 වැටුප් පරිමාණය - රු.25250- 10X270- 10X300-10X330-12X350-38450/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු.25,250/- |
| II | පියවර 12 | රු.28, 250/- |
| I | පියවර 22 | රු.31, 280/- |
| විශේෂ | පියවර 32 | රු.34, 600/- |

සටහන
බඳවා ගැනීම්, උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණ සඳහන් කිරීමේදී
03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උප ලේඛණ I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන්
යුතුය. එහෙත් ගෙවීම් කල යුත්තේ උප ලේඛණ II හි සඳහන් පරිදි බැවි පත්වීම් ලිපියෙහි සඳහන් කල යු

06 සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ආරක්ෂක නියාමක | III/II/I සහ විශේෂ ශ්‍රේණිය | 168 | i. කොළඹ මහා නගර සභා ප්‍රධා කාර්යාලයේ හා නගර සභාව සතු අනෙ සේවා ස්ථාන වල චංචල හා නිශ්චල දේපල ආරක්ෂා කිරීම,<br>ii. ආයතනයට සම්බන්ධ ප්‍රභුවරුන්ගේ නිලධාරීන්ගේ ආරක්ෂාව සැලසීම.<br>iii. ආයතනයට පැමිණෙන මහජනයා වාහන පිළිබඳ පරීක්ෂාකාරී වීම හා වාහන පාලනය<br>iv. සරප් අංශයේ රාජකාරී හා නගර ශාල තුල හා අවශ්‍ය අවස්ථාවලදී ගිනි ආරක්ෂාව සැපයීම.<br>v. මාර්ගස්ථ මුදල් ප්‍රවාහන කාර්යයේදී අවි ආරක්ෂාව සැලසීම.<br>vi. රාජකාරියට අදාළව ඉහළ ආරක් නිලධාරීන්ගේ උපදෙස් හා නියෝ ක්‍රියාත්මක කිරීම.<br>vii. දෙපාර්තමේන්තු ප්‍රධාන/ ආයතන ප්‍රධා විසින් පවරනු ලබන ඕනෑම රාජකාරිය ඉටු කිරීම |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...........
දිනය : ...........

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

කොළඹ මහා නගර සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුල ශ්‍රේණිගත උසස් කිරීමේ කාර්යය සඳහා ඒ ඒ තනතුරට අදාළව III/ II / I විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.

07 බඳවා ගැනීමේ ක්‍රමය -

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාල නොවේ |
| කුසලතා | අදාල නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :-

සංලක්ෂය

අධ්‍යාපන සුදුසුකම් අනුව තෝරා ගන්නා අයදුම්කරුවන් කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු කිරීම් ආයතනය මගින් පවත්වනු ලබන ආරක්ෂක සේවාව පිළිබඳ මසක පුහුණුව

හා

කොළඹ මහා නගර සභාවේ පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ගිනි අවි පුහුණුව (සති දෙකක)සාර්ථකව නිම කිරීමෙන් පසු ආරක්ෂක නියාමක III ශ්‍රේණිය සඳහා අනුයුක්ත කරනු ලැබේ.

7.2.2.3 පළපුරුද්ද :- අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් :- සෑම අපේක්ෂකයෙක්ම කොළඹ නාගරික බල ප්‍රදේශය තුල සේවය කිරීමටත් තනතුරට අදාල රාජකාරි කටයුතු ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම. ( පිරිමි නියාමකයින් උස අඩි 5 "3" නොඅඩු වීම හා හුස්ම හෙලූ විට පපුව අඟල් 32 කට නොඅඩු වීම. කාන්තා නියාමකින් සඳහා උස අඩි 5 "2" නොඅඩු වීම.)

නගර ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : [illegible]
දිනය : [illegible]

7.2.2.5 වෙනත්

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

355

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවු. 18 නොඅඩු විය යුතුය.

7.2.3.2 උපරිම සීමාව :- අවු. 45 ට නොවැඩි විය යුතුය.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ අයදුම්කරුවන් ලිඛිත විභාගයේ ගන්නා ලද ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම සිදු කල යුතුය.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

විභාග විෂය නිර්දේශය (උපලේඛන 01)

7.2.4.1.1 පවත්වන බලධරයා:- පත්කිරීම් බලධරයා

7.2.4.2 වෘත්තීය පරීක්ෂණ :- අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු :-

මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව (උස හා පපුව පිළිබඳ යෝග්‍යතාව) පරීක්ෂා කිරීම පමණක් මෙහිදී සිදු කරනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :- පත්කිරීම් බලධරයා

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- ඉහත සඳහන් අයදුම්කරුවන් අතුරින් උස හා පපුව පිළිබඳ යෝග්‍යතා පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන්නන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ.

ගොනු අංකය : ............
දිනය : ............

7.2.4.5 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන නිර්නායකයන්.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ක්‍රීඩා හා කුසලතා ජාතික මට්ටමේ කුසලතා පළාත් මට්ටමේ කුසලතා සමස්ථ ලංකා කුසලතා පාසැල් මට්ටමේ කුසලතා වෙනත් | 50 | 50 |
| ශිෂ්‍ය භට කණ්ඩායම් කුසලතා | 15 | |
| ආරක්ෂක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා පුහුණුව | 15 | |
| ගිණි ආරක්ෂණය පිළිබඳ පළපුරුද්ද හා පුහුණුව | 15 | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

උපලේඛණ අංක 02 හි විෂය නිර්දේශය දැක්වේ.

7.2.4.5.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ පත්කිරීම් බලධාරියා

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ පුවත්පත් වල ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ. මීට අමතරව වෙබ් අඩවියේ ද දැන්වීම් පළ කළ හැක.

7.3 සීමිත බඳවාගැනීම අදාළ නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලිපි අංකය : 6-1/A2/14/7/337
දිනය : 2018/6/14

8 කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය වාචික/ ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණය (උප ලේඛණ 03) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණය (උප ලේඛණ 04) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උප ලේඛණ 05) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වසරකට වරක් හෝ අවශ්‍යතාවය මත

(357)

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3 වන කාර්යක්ෂමතා කඩඉම | පත්කිරීම් බලධරයා |

09 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| 1.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුන නිලධාරීන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල දී ලබා ගත යුතුය. |
| 2.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3.සන්ධාන භාෂාව(අදාළ වන්නේ නම් පමණි) | අදාළ නොවේ |

10 ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබී

(iii) අනුමත කාර්යය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වී දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්යය සාධනයක් පෙන්නුම් ක තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළ දී ලබා තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත අ පත්‍රය(ඇමුණුම 01) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් ප කිරීමෙන් අනතුරුව III ශ්‍රේණියේ වසර 10 සම්පූර්ණ ක දිනය හෝ සුදුසුකම් ලබන දිනය යන දින දෙකෙන් ප එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උ කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක් (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

(ii) අනුමත කාර්යය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම් 01) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව II ශ්‍රේණියේ වසර (09) සම්පූර්ණ කරන දිනය හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක් (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

(ii) අනුමත කාර්යය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස්කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම් 01) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව

359

I ශ්‍රේණියේ වසර (09) සම්පූර්ණ කරන දිනය හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11 තනතුරුවලට පත්කිරීම :- අදාළ නොවේ

12 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන නියෝග වලටද අනුව කටයුතු කල යුතුය.

13 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14 ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සියළුම දෙනා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ වැටුප් පරිවර්තන ක්‍රමවේදය අනුව පහත සඳහන් පරිදි නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එහෙත් අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයේ වෙනසක් නොවන අතර එම අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය නොවෙනස්ව ක්‍රියාත්මක වේ. එසේම අනුරූපී වැටුප් පියවරක් හිමිවීම හේතු කොටගෙන වඩා ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොලැබේ.

ඉහත විධිවිධාන පරිදි අදාළ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව එකී ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය අවම සේවා කාලයට වැඩියෙන් සේවය කර ඇති කාල සීමාව ඊළඟ ශ්‍රේණියට උසස් කිරීමේදී අවශ්‍ය සේවා කාලයට එකතු කරනු ලැබේ.

මෙම පරිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින් අන්තර්ග්‍රහණය කරන ලද ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු වන අතර ඒ සඳහා වසර 03 සහන කාලයක් ලබා දෙනු ඇත.

<u>III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම</u> :-

මෙම බඳවා ගැනීම් පරිපාටිය අනුමත වන දිනට ආරක්ෂක නියාමක III වන ශ්‍රේණියේ සේවකයින් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

<u>II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-</u>

මෙම බඳවා ගැනීම් පරිපාටිය අනුමත වන දිනට ආරක්ෂක නියාමක II වන ශ්‍රේණියේ සේවකයින් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

360

**I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

මෙම බඳවා ගැනීම් පරිපාටිය අනුමත වන දිනට ආරක්ෂක නියාමක I ශ්‍රේණියේ සේවකයින් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම-**

මෙම බඳවා ගැනීම් පරිපාටිය අනුමත වන දිනට ආරක්ෂක නියාමක විශේෂ ශ්‍රේණියේ සේවකයින් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සටහන :- ඉහත අංක 14 පරිදි **අන්තර්ග්‍රහණය** කළ නිලධාරීන් **අන්තර්ග්‍රහණය** කල **ශ්‍රේණියට** අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කල යුතු අතර දැනටමත් පෙර අනුමත පරිපාටිය අනුව අදාළ **ශ්‍රේණියට අයත්** කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර තිබේ නම් නව පරිපාටිය යටතේ **අන්තර්ග්‍රහණය** වූ **ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම අවශ්‍ය නැත.**

15 මෙම පරිපාටියේ විධිවිධාන සළසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැන නගින අවස්ථාවලදී හා /හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

16 අර්ථ නිරූපණ : -

සතුටුදායක සේවා කාලය

පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මඟින් ද සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම මඟින් ද සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින් ද එම කාලය තුලදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය .

නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නිත්‍යානුකූල හේතු මත අත්හිටුවා , අඩු කොට නතර කොට හෝ විලම්බනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද ආයතන සංග්‍රහයේ 11 කාණ්ඩයේ ,වැරදි පිළිබඳ පළමු වැනි උප ලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය .

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 605/1/2/4/1/2/334
දිනය : 2018/5/11

සක්‍රිය සේවා කාලය :

" සක්‍රිය සේවා කාලය " යනු ස්ථිර තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

නියමිත දිනට :

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය , " නියමිත දිනට " ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස් වීම් වලදී නියමිත දිනට හෝ පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

361

උදා- වසර තුනකදී සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වුවහොත් දහයකින් ලැබිය යුතු උසස් වීම ලැබෙනුයේ වසර එකොලහකිනි.

සකස් කළේ: අත්සන ..........
නිර්දේශ කිරීම ඉදිරිපත් කරමි
දිනය 17.10.26

කේ. පී. එම්. මෛත්‍රීරත්න
පරිපාලන නිලධාරී
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
කොළඹ 07

පරීක්ෂා කළේ : ජී. කේ. සී. කුලරත්න
(විෂයහාර මාණ්ඩලික නිලධාරියා)
නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් (පා.ලු.)
පළාත් පාලන දෙපාර්තමේන්තුව
අත්සන .......... බස්නාහිර පළාත 17.11.08
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම
තනතුර චන්ද්‍රානි සමරකෝන්
නිලමුද්‍රාව පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත 17.11.09
යොමු අංකය: ..........

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය

අත්සන : ..........
නම : ..........
.......... අමාත්‍යංශ
නිලමුද්‍රාව

චන්ද්‍රානි සමරකෝන්
ලේකම් (වැ.බ.),
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය
(බස්නාහිර පළාත)
2017/11/17

යොමු අංකය: ..........

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2018/1/10

අත්සන : ..........
නම : ..........
ප්‍රධාන ලේකම් (බ.ප)
නිලමුද්‍රාව

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය: WPC/PSC/ADM/16/1/17

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය 2018.04.24

අත්සන : ..........
නම : ..........
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිලමුද්‍රාව

එම්. ජී. ඒ. තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය: ..........

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.
යොමු අංකය : ..........
දිනය : 2018/5/14

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුර සඳහා වන බඳවාගැනීමේ පරිපාටිය 2018/5/14 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

දිනය 2018/5/17

අත්සන : ..........
නම : ..........
ආණ්ඩුකාර ලේකම්
නිලමුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

උප ලේඛණ අංක 01

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ (ලිඛිත) විභාගය**

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ (ලිඛිත) විභාගය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇති වූ අවස්ථා වලදී

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනුම | ජාතික කළාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුල පවතින සාමාජික,සංස්කෘතික, අධ්‍යාපනික විද්‍යාත්මක දේශපාලනමය. ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධ ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි. |
| බුද්ධි පරීක්ෂණය | සාමාන්‍ය බුද්ධිය හා තර්කන ශක්තිය මැන බැලීම සඳහා ගණිතමය ගැටලු අතුළත් ප්‍රශ්න පත්‍රයකි. |

(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම ...............................................
තනතුර ..........චන්ද්‍රානි සමරකෝන්........
දිනය ..........පළාත් පාලන කොමසාරිස්....
නිලමුද්‍රාව ..........බස්නාහිර පළාත..........

17.11.19

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : Gov/AD-14/12/334
දිනය : 2018.5.14

උප ලේඛණ අංක 01

බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ (ලිඛිත) විභාගය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම :- බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ (ලිඛිත) විභාගය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇති වූ අවස්ථා වලදී

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනුම | ජාතික කළාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුල පවතින සාමාජික,සංස්කෘතික, අධ්‍යාපනික විද්‍යාත්මක දේශපාලනමය. ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධ ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි. |
| බුද්ධි පරීක්ෂණය | සාමාන්‍ය බුද්ධිය හා තර්කන ශක්තිය මැන බැලීම සඳහා ගණිතමය ගැටලු අතුළත් ප්‍රශ්න පත්‍රයකි. |

(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම ..........
තනතුර ......චන්ද්‍රානි සමරකෝන්......
දිනය ......පළාත් පාලන කොමසාරිස්......
නිලමුද්‍රාව ......බස්නාහිර පළාත......

17.11.9

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලොකු අංකය : ......
දිනය : ......

(363)

උප ලේඛණ අංක

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක

නියාමක තනතුරේ **III ශ්‍රේණිය** සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තන III **ශ්‍රේණිය** සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02 සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ක්‍රීඩා හා කුසලතා<br>ජාතික මට්ටමේ කුසලතා<br>පළාත් මට්ටමේ කුසලතා<br>සමස්ත ලංකා කුසලතා<br>පාසල් මට්ටමේ කුසලතා<br>වෙනත් | 50 | |
| ශිෂ්‍ය භට කණ්ඩායම් කුසලතා | 15 | 50 |
| ආරක්ෂක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා පුහුණුව | 15 | |
| ගිණි ආරක්ෂණය පිළිබඳ පළපුරුද්ද හා පුහුණුව | 15 | |
| | | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...2/1/12/33...
දිනය : ...2018/5/11...

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී

සකස් කළේ අත්සන ....................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම ඒ. කේ. පී. එම්. මෛත්‍රීරත්න
තනතුර පරිපාලන නිලධාරී, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.), කොළඹ 07
දිනය 17.10.27

පරීක්ෂා කළේ අත්සන ....................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් (රා.ගු.)
තනතුර පළාත් පාලන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත
දිනය 17.11.08

අත්සන ....................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම චන්ද්‍රානි සමරකෝන්
තනතුර පළාත් පාලන කොමසාරිස්
දිනය බස්නාහිර පළාත

17.11.9

උප ලේඛණ අංක 03

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ III ශ්‍රේණිය සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)**

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ III ශ්‍රේණිය සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (වාචික)

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර: -

| ප්‍රශ්න පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්ලකුණු |
|---|---|---|---|
| ආයතන කාර්යය පරිපාටිය | අවශ්‍යතාවය පරිදි | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :- පත්කිරීම් බලධරයා විසින් පත් කරනු ලබන මාණ්ඩලික නිලධාරින් තිදෙනෙකු විසින් පවත්වනු ලැබේ.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය අනුව

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්යය පරිපාටිය | බස්නාහිර පළාත් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ VII,XII,XVI,XXI ආශ්‍රයෙන් සකස් කල ප්‍රශ්නාවලියකි. |

(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම ........ චන්ද්‍රානි සමරකෝන්
තනතුර ........ පළාත් පාලන කොමසාරිස්
දිනය ........ බස්නාහිර පළාත
නිලමුද්‍රාව ........

17.11.9

උප ලේඛණ අංක 04

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ

ආරක්ෂක නියාමක තනතුරේ **II ශ්‍රේණිය** සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය(වාචික

1.විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ **II ශ්‍රේණිය** සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය (වාචික)

2. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | අවශ්‍යතාවය පරිදි | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය අනුව

5.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | තනතුරට අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රශ්නාවලියකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : ..........
දිනය : ..........

(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම ..........
තනතුර .......... චන්ද්‍රානි සමරකෝන්
දිනය .......... පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත
නිලමුද්‍රාව ..........

උප ලේඛණ අංක 05

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ I ශ්‍රේණිය සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)**

1. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරේ I ශ්‍රේණිය සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්ලකුණු |
|---|---|---|---|
| කාර්යාල ක්‍රම හා ආයතන කටයුතු | පැය 01 | 100 | 40 |

3. විභාගය පවත්වනු ලබන බලධරයා :- පත්කිරීම් බලධරයා

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය අනුව

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල ක්‍රම හා ආයතන කටයුතු | කාර්යාලයක භාවිතා වන සාමාන්‍ය කාර්යාල ක්‍රම පිළිබඳව හා රාජකාරී කටයුතු ආශ්‍රයෙන් සකස් කල දැනුම පරීක්ෂා කිරීමේ කෙටි ප්‍රශ්න ඇතුලත් ප්‍රශ්න පත්‍රයකි. |

(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම ..............................
තනතුර ......චන්ද්‍රානි සමරකෝන්......
දිනය ......පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත......
නිලමුද්‍රාව ..............................

17.11.9

ඇමුණුම :

<u>බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආරක්ෂක නියාමක තනතුරට අදාල සාමාන්‍ය කාර්ය සාධනය යටතේ 11/1/ විශේෂ ශ්‍රේණියට උසස් ලබාගැනීම සඳහා වූ අයදුම්පත</u>

1. නිලධාරියා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................

1.2 හැඳුනුම්පත් අංකය : ..................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..................................................

1.4 අයත් වන සේවය හා තනතුර : ..................................................

1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය : ..................................................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..................................................

ගරු කොමසාරිස්තුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දින |
| --- | --- | --- |
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දින |
| --- | --- | --- |
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / විශේෂ

3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.3.1 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3.2 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ....................................

3.3.3 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත
උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ II / I / විශේෂ ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ............................................ ..................................................................
නිලධරයාගේ අත්සන

5. දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඉහත නම් සඳහන් ........................................ මහතා / මිය / මෙනවිය ............................ සේවා ගණයේ ............................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත්වෙමි.ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන :
..............................................................

නිල මුද්‍රාව :
..............................................................

... විසින් අනුමත කරන ...
: 6-7/AZ/1/4/2/3.34
: 2018/5/11
: ..................................